# පුංචි මෙකෝ



තාරුන්දි අර්සකුලසූරිය

# පුංචි මෙකෝ

කතෘ: තාරුන්දි අර්සකුලසූරිය
සියලුම හිමිකම් ඇවිරිණි

කතෘගේ වෙනත් කෘති :

- කුරුලු කූඩුව
- අපි හොඳ ළමයින් වෙමු

මහාමායා බාලිකා විදුහල, මහනුවර
5 ශ්‍රේණිය C

කෘතිය පළ කරන දින: 2025.02.08

ISBN: 9786242085135

# පිදුම

මා දයාබර මහාමායාවට සහ

මට උපකාර කළ සැමට

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක රටක පුංචි මී පැටියෙක් හිටියා. එයාගේ නම තමයි මෙකෝ. එයා ජීවත් වුණේ එයාගේ අම්මයි තාත්තයි එක්ක. මෙකෝ තමයි එයාගේ අම්මාටයි තාත්තාටයි හිටපු එකම ළමයා.




එයා පවුලේ එකම ළමයා නිසා මෙකෝගේ අම්මයි තාත්තයි මෙකෝට ගොඩක් ආදරෙයි.

ඒක නිසා මෙකෝට කවමදාකවත් එළියෙ සෙල්ලම් කරන්නවත්, එළියෙ ඇවිදින්නවත් දීලා නෑ. එයාලා ගොඩක් බය වුණා කවුරු හරි ලොකු සතෙක් මෙකෝට කරදරයක් කරයි කියලා.මේ නිසා මෙකෝට කිසිම යාළුවෙක් හිටියෙ නැහැ.ඒ නිසා මෙකෝ ගොඩක් දුකෙන් හිටියේ.



සමහර දවස් වල යාළුවෝ සෙල්ලම් කරනවා මෙකෝ දකිනවා. එතකොට මෙකෝට ගොඩක් දුකයි. මෙකෝ දුකෙන් ඉන්නකොට එයාගේ අම්මටයි තාත්තටයි ගොඩක් දුකයි.



මෙකෝගේ තාත්තා දවසක් දා  මෙකෝට පොරොන්දු වුනා එයාගේ උපන් දිනේ දවසේ එයාට අලුත් යාළුවෝ අඳුරගන්න, සෙල්ලම් කරන්න, එළියේ ඇවිදින්න අවස්ථාව දෙනවා කියලා.



ඉතින් ඔන්න මෙකෝ උපන්දිනය දවසේ උදේම නැගිටලා, මුහුණ සෝදලා, එයාට අම්මා අලුතෙන් ම මහපු ඇඳුමත් ඇඳගෙන එළියට ගියා.



ඔන්න ටික දුරක් ඇවිදගෙන යනකොට ලොකුම ලොකු රාජාලියෙක් මෙකෝව අරගෙන යන්න හැදුවා. මෙකෝ ඒකෙන් නූලෙන් බේරුණා. මෙකෝ හති දම දම ගෙදර දිවුවා. මෙකෝ ගොඩක් බය වුණා.



මේක මෙකෝගේ තාත්තාගේ සැලසුමක්. මෙකෝගේ තාත්තාට දවසක් වැඩට යනකොට හම්බවුණා ගොඩක් අමාරුවෙන් ඉන්න රාජාලියෙක්. මෙකෝගේ පවුලේ හැමෝම රාජාලියන්ට ගොඩක් බයයි. ඒත් මෙකෝගේ තාත්තා ගොඩක් හොඳ කෙනෙක්.



මෙකෝ්ගේ තාත්තා ඇත ඉදන්ම රාජාලියාගෙන් ඇහුවා, “ මම ඔයාට උදව් කරොත් ඔයා මට කරදරයක් කරන්නේ නැද්ද?” කියලා.

එතකොට රාජාලියා කිව්වා “අපොයි, නෑ! මගේ මේ තුවාලය නිසා මට මොකුත් කරගන්න බැරුවයි ඉන්නේ. මට උදව් කරන්න පුළුවන් නම් මම ඔයා කියන ඕනෑම දෙයක් කරන්නම්!” කියලා. ඊට පස්සේ මෙකෝ්ගේ තාත්තා කිව්වා “හා හොඳයි, මම ඔයාට උදව් කරන්නම්.”

ඊට පස්සේ මෙකෝ්ගේ තාත්තා රාජාලියාට උපකාර කරා. “ඔබට බොහෝම ස්තූතියි මාව බේරගත්තට ඔයාට මොනවද මගෙන් කෙරෙන්න ඕන?” කියලා රාජාලියා ඇහුවා.



“හෙට මගේ පුතාගේ උපන්දිනය තියෙනවා. මම එයාට පොරොන්දු වුණා එයාව එළියට එක්කරගෙන යනවා කියලා. මට ඕන මේ වගේ වැඩක් කරන්න…”කියලා මෙකෝගේ තාත්තා කිව්වා.

ඉතිං ඔන්න ඔහොමයි සැලසුම වුණේ. මේ කතාව දවසක් දා මෙකෝ'ට ඇහුණා.මෙකෝ' ගොඩක් දුක් වුණා. දුක වැඩි නිසා මෙකෝ' කාටවත්ම කියන්නේ නැතිව එළියට ගියා. ඒ වුණාට මේක මෙකෝ'ගේ අම්මයි තාත්තයි දැනගෙන හිටියා.



මෙකෝගේ තාත්තා කලබලයෙන් මෙකෝට හොරෙන් මෙකෝ පිටිපස්සෙන් ගියා. එතකොට මෙකෝ දකිනවා කූඹි පේළියක්. මේ කූඹි පේළිය එක්කෙනා පිටිපස්සේ යන්නේ ගහක් උඩට.



මේ ගහ උඩ ඉන්නවා එක කුරුල්ලෙක්. මේ කුරුල්ලා එක්කෙනා පිටිපස්සේ එන කූඹි පේළියේ හැම කූඹියෙක්වම කනවා.

මෙකෝ මේ දිහා බලාගෙන හිටියා. මෙකෝ ටිකක් කල්පනා කරලා මෙහෙම දෙයක් කරා.



මෙකෝ මේ කූඹි පේළියේ එක කූඹියෙක්ව කිසිම කරදරයක් නොකර අනික් පැත්තට හැරෙව්වා. ඉතිං මේ කූඹි පේළිය පේළියටනෙ යන්නෙ, අර කූඹියා අනික් පැත්තට හැරුණාම, ඒ කූඹියා පිටිපස්සෙ හිටපු හැම කූඹියෙක්ම ඒ කූඹියා යන පැත්තට ගියා. දැන් ඉතින් ගහ උඩ ඉන්න කුරුල්ලට ආය කූඹියෝ කන්න බැහැනේ.



මෙකෝ මේ කරපු හොඳ දෙය මෙකෝගේ තාත්තා දැක්කා. මෙකෝ කරපු හොඳ වැඩේට මෙකෝගේ තාත්තාට හරිම සතුටුයි. මෙකෝගේ තාත්තා දැන ගත්තා මෙකෝට හොඳට මොළය තියෙන බව. සහ මෙකෝ එයා ගැන විතරක් ම නෙවෙයි අනිත් අය ගැනත් ඒ වගේම හිතනවා කියලා. එදා මෙකෝගේ තාත්තා තේරුම් ගත්තා මෙකෝ ගැන එයාට බය වෙන්න ඕනෙ නෑ කියලා. එදා ඉඳලා මෙකෝගේ තාත්තා මෙකෝට ඕන තරම් හිතේ හැටියට සෙල්ලම් කරන්න, යාළුවෝ අඳුරගන්න, ඉස්කෝලෙ යන්න දුන්නා.

ඉතිං මගේ යාළුවනේ මේ කතන්දරයෙන් කියන්නේ පුංචි සිතුවිල්ලක් ඇති ගොඩක් දේවල් වෙනස් කරන්න. ඒ වගේම තමයි අපි අපේ ගැන විතරක් නෙවෙයි, අනුන් ගැනත් හිතන්න ඕන කියලා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN: 9786242085135